## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

අංක 1877/27 දරන 2014 අගෝස්තු මස 28 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1996/25 හා 2016 දෙසැම්බර් මස 06 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍රයෙන් සංශෝධනය කරන ලද 2006.01.01 දින සිට බලාත්මක වන ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3 වගන්තිය හා අනුමත බඳවා ගැනීම් පරිපාටිවල විධිවිධාන ප්‍රකාරව, පහත සඳහන් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල පවතින පුරප්පාඩු 12ක් සඳහා ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධරයන් එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පුරප්පාඩු සංඛ්‍යාව:

| අනු අංකය | අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | කාරණය |
|---|---|---|---|---|
| 01 | ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | ආණ්ඩුවේ රස පරීක්ෂක | 01 | විශේෂ ශ්‍රේණියට උසස් කිරීම |
| | | ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක | 02 | විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තනතුරට පත් කිරීම |
| 02 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | වන සංරක්ෂක ජනරාල් | 01 | විශේෂ ශ්‍රේණියට උසස් කිරීම |
| | | අතිරේක වන සංරක්ෂක ජනරාල් (වන ආරක්ෂණ, මෙහෙයුම් හා කළමනාකරණ)<br><br>අතිරේක වන සංරක්ෂක ජනරාල් (පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු) | 01<br><br>01 | විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තනතුරට පත් කිරීම |
| 03 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් | 01 | විශේෂ ශ්‍රේණියට උසස් කිරීම |
| 04 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂ ජනරාල් | 01 | විශේෂ ශ්‍රේණියට උසස් කිරීම |
| 05 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂ ජනරාල් | 01 | විශේෂ ශ්‍රේණියට උසස් කිරීම |
| | | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 | විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තනතුරට පත් කිරීම |
| 06 | වනජීවී සංරක්ෂණ දෙපාර්මේන්තුව | වනජීවී අධ්‍යක්ෂ ජනරාල් | 01 | විශේෂ ශ්‍රේණියට උසස් කිරීම |
| 07 | පරිසර අමාත්‍යාංශය | අතිරේක ලේකම් (පරිසර ප්‍රතිපත්ති සැලසුම්) | 01 | විශේෂ ශ්‍රේණියට උසස් කිරීම හා තනතුරට පත් කිරීම |

02. උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්.

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් හෝ අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ නිශ්චිතව සඳහන් කරන ලද විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

II. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන ඇති නිලධරයෙකු වීම.

III. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ වසර 18කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහක් (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේක: 01/2020 අනුව උසසවීම් සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම.

VI.

| අනු අංකය | දෙපාර්තමේන්තුව / අමාත්‍යාංශය | තනතුර | සුදුසුකම |
|---|---|---|---|
| 01 | ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | ආණ්ඩුවේ රස පරීක්ෂක<br>ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක | I සිට V දක්වා සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය රස පරීක්ෂක තනතුර දරන නිලධරයෙකු වීම. |
| 02 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | වන සංරක්ෂක ජනරාල් | I සිට V දක්වා සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධරයෙකු වීම. |
| | | අතිරේක වන සංරක්ෂක ජනරාල් (වන ආරක්ෂණ, මෙහෙයුම් හා කළමනාකරණ) | I සිට V දක්වා සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන සංරක්ෂක (ආරක්ෂණ හා නීති ක්‍රියාත්මක කිරීම /සමාජ වන ව්‍යාප්ති / වන විද්‍යා හා වන කළමනාකරණ / සැලසුම් හා ප්‍රතිපත්ති පාලන / පරිසර සංරක්ෂණ හා කළමනාකරණ / වන සංගණන හා භූ විද්‍යා තොරතුරු / පරිසර සංචාරක / ජෛව විවිධත්ව හා ජලාධාර සංරක්ෂණ) යන තනතුරක සේවයේ නියුතු නිලධරයෙකු වීම. |
| | | අතිරේක වන සංරක්ෂක ජනරාල් (පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු) | I සිට V දක්වා සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන සංරක්ෂක (අධ්‍යාපන සහ ධාරිතා සංවර්ධන / පර්යේෂණ) යන තනතුරක සේවයේ නියුතු නිලධරයෙකු වීම. |

| | | | |
|---|---|---|---|
| 03 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් | I සිට V දක්වා සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධරයෙකු වීම. |
| 04 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂ ජනරාල් | I සිට V දක්වා සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ නිලධරයෙකු වීම. |
| 05 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂ ජනරාල් | I සිට V දක්වා සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයෙකු වීම. |
| | | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | |
| 06 | වනජීවී සංරක්ෂණ දෙපාර්මේන්තුව | වනජීවී අධ්‍යක්ෂ ජනරාල් | I සිට V දක්වා සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධරයෙකු වීම. |
| 07 | පරිසර අමාත්‍යාංශය | අතිරේක ලේකම් (පරිසර ප්‍රතිපත්ති හා සැලසුම්) | I සිට V දක්වා සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ පරිසර අමාත්‍යාංශයේ හෝ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධරයෙකු වීම. |

03. උසස් කිරීමේ ක්‍රමය.

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර එහි ප්‍රතිඵල හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.

(ii) සම්මුඛ පරීක්ෂණයේදී ජ්‍යෝෂ්ඨත්වය හා කුසලතාව ඇගයීමට ලක් කරනු ලැබේ. ඒ සඳහා ඇමුණුම I හි වන ලකුණු පරිපාටිය යොදා ගනු ලැබේ.

04. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථාවේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1877/27 දරන 2014.08.28 දිනැති ගැසට්පත්‍රයේ පළ කරන ලද) එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද යටත්ව, ඉහත කී සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව තෝරා ගනු ලබන නිලධරයින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

05. සම්මුඛ පරීක්ෂණයේ දී එක් එක් තනතුරට අදාළව ඉහළම ලකුණු ලබාගෙන ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධරයා / නිලධරයින් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වීම් බලධරයා වන තනතුරු සඳහා එම කොමිෂන් සභාව විසින් පත් කරනු ඇත.

06. පහත ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානියා / අමාත්‍යාංශ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා / අමාත්‍යාංශ ලේකම් වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට අත්සන් කර එම අත්සන දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කර දෙපාර්තමේන්තු ප්‍රධානීගේ / අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශයද සහිතව, ලියාපදිංචි තැපෑලෙන් 2021 අප්‍රේල්

මස 09 දිනට හෝ එදිනට පෙර ලැබෙන පරිදි " ලේකම්, රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය ,කොළඹ 07 " යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර නොගන්නා අතර, අයදුම්පත්‍ර අස්ථානගත වීම හෝ ප්‍රමාදවීම සම්බන්ධයෙන් පැමිණිලි ද භාර ගනු නොලැබේ.

07. මෙම නිවේදනයෙහි සිංහල, දෙමළ, ඉංග්‍රීසි පිටපත්වල කරුණු අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල පිටපත බලාත්මක වේ.

අයදුම්පත්‍රය www.pubad.gov.lk ඔස්සේ ද බාගත කල හැකිය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

2021 මාර්තු මස 24 වැනි දින
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පරිපාටිය**

**01. ජ්‍යෙෂ්ඨත්වය ලකුණු 60**

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සක්‍රීය හා සතුටුදායක මුළු සේවා කාලය සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 අනුව එක් එක් අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ඉහළම සේවා කාලයක් සහිත නිලධරයාට උපරිම ලකුණු ප්‍රමාණය ද අනෙකුත් නිලධරයන්හට ඊට සමානුපාතික ලෙස ද ලකුණු ලබා දෙනු ලැබේ.

**02. කුසලතාව ලකුණු 40**

I.

| | | උපරිම ලකුණු |
|---|---|---|
| I. | ක්ෂේත්‍රයට අදාළව කේවල හෝ කණ්ඩායම් වශයෙන් සිදු කරන ලද; | 08 |
| i. | පර්යේෂණාත්මක ප්‍රකාශන (Research Publication) (කණ්ඩායම් ප්‍රකාශන සඳහා අදාළ නිලධරයාගේ මූලිකත්වයෙන් කරනු ලැබූ ප්‍රකාශන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තහවුරු කළ යුතුය) - එක් ප්‍රකාශනයක් සඳහා ලකුණු 04 බැගින් (උපරිම ප්‍රකාශන 4ක් සඳහා) | |
| ii. | සාරාංශ (Abstract)<br>➢ ශ්‍රී ලංකාව තුළ (Local ) - එක් සාරාංශයක් සඳහා ලකුණු 02 බැගින් (උපරිම සාරාංශ 2ක් සඳහා)<br>➢ ජාත්‍යන්තර (International ) - එක් සාරාංශයක් සඳහා ලකුණු 02 බැගින් (උපරිම සාරාංශ 2ක් සඳහා) | |
| II. | නිබන්ධන - එක් නිබන්ධනයක් සඳහා ලකුණු 2.5 බැගින්<br>( දෙවන කාර්යක්ෂමතා කඩඉම හෝ I ශ්‍රේණියට උසස්වීමට සලකනු ලැබූ පශ්චාත් උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනය හැර වෙනත් නිබන්ධන සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)<br>(උපරිම නිබන්ධන 2ක් සඳහා) | 05 |
| III. | නව්‍යතා / නවෝත්පාදන - අදාළ නිලධරයාගේ මූලිකත්වයෙන් සාර්ථකව ක්‍රියාත්මක වූ නවෝත්පාදනයන් බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තහවුරු කළයුතු වේ (එක් නව්‍යතාවක් / නවෝත්පාදනයක් සඳහා ලකුණු 04 බැගින්)<br>(උපරිම නව්‍යතා / නවෝත්පාදන 2ක් සඳහා) | 08 |
| IV. | පුවත්පත් / සඟරා ලිපි - තමා විසින් ජනතාව දැණුවත් කිරීමට ලියන ලද ලිපි ලේඛන (එක් පුවත් පතක් / සඟරාවක් සඳහා ලකුණු 02 බැගින්)<br>(උපරිම පුවත්පත් / සඟරා ලිපි 2ක් සඳහා) | 04 |
| මුළු ලකුණු | | 25 |

II. ඉදිරිපත් කිරීම (Power Point Presentation) (ලකුණු - 15)

උක්ත I. හි සඳහන් නව්‍යතා / නවෝත්පාදන කාර්යයක් සම්බන්ධයෙන් පරිගණකය ආශ්‍රයෙන් (Power Point) සිදු කරනු ලබන විනාඩි 10ක ඉදිරිපත් කිරීම.

| | | | |
|---|---|---|---|
| i. | තෝරාපත් කරන තනතුරෙහි කාර්ය සාධනය සඳහා අරමුණු සහ දැක්මෙහි පවතින සබඳතාවය - (Objective & Vision related to the Performance of the post to be Selected) | - | ලකුණු 03 |
| ii. | අදාළත්වය (Relevancy) | - | ලකුණු 03 |
| iii. | නිර්මාණශීලීත්වය / නව්‍යතා (Creativity / Innovation) | - | ලකුණු 03 |
| iv. | කාල කළමනාකරණය (Time Management) | - | ලකුණු 03 |
| v. | ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව (Proficiency) | - | ලකුණු 03 |

සටහන -

අ) ඉහත (v) නිර්ණායකය යටතේ ලකුණු ලබා ගත හැක්කේ අයදුම්කරු ඉංග්‍රීසි භාෂාව මගින් මෙම ඉදිරිපත් කිරීම සිදු කරන්නේ නම් පමණි.

ආ) ඉදිරිපත් කිරීමට අදාළ දෘඩ පිටපත (Hard Copy) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට එම අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය. අමතර වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකසන ලද ඉදිරිපත් කිරීමේ දෘඩ පිටපතක් ද මෙම අවස්ථාවේ දී ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

**ආදර්ශ අයදුම් පත්‍රය**

........................................................... අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියට උසස්වීම සඳහා ඉල්ලුම් කිරීම හා විශේෂ ශ්‍රේණියේ .............................................. තනතුර සඳහා ඉල්ලුම් කිරීම

1. නිලධාරියා සම්බන්ධ තොරතුරු
   i. සම්පූර්ණ නම
      (ඉංග්‍රීසියෙන්) ........................................................................................................
      (උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
   ii. මුලකුරු සමඟ නම ( ඉංග්‍රීසියෙන් ):........................................................................
      (උදා: GUNAWARDHANA, H. M. S. K.)
   iii. සම්පූර්ණ නම (සිංහලෙන්):.....................................................................................
   iv. උපන් දිනය:.................................................................
   v. අයදුම්පත භාර ගන්නා අවසන් දිනට වයස: අවු........... මාස................දින..................
   vi. ජාතික හැඳුනුම්පත් අංකය : ............................
   vii. ස්ථිර ලිපිනය :...............................................................................................
      ........................................................................................................................
   viii. දුරකථනය අංකය :
      කාර්යාලය : ...........................
      ජංගම :................................

2. තනතුර පිළිබඳ තොරතුරු :
   i. වර්තමාන සේවා ස්ථානය හා ලිපිනය :
   ii. දැනට අයත් ශ්‍රේණිය හා එම ශ්‍රේණියට පත් වූ දිනය:
   iii. දැනට දරන තනතුර:
   iv. එම තනතුරට පත් වූ දිනය:
   v. ලබා ඇති පශ්චාත් උපාධිය හා එය ලබා ඇති ක්ෂේත්‍රය:

3. ක්ෂේත්‍රයට අදාළ සුදුසුකම්:

3.1. අදාළ ක්ෂේත්‍රය සඳහා දක්වන ලද විශේෂ දායකත්වය

| **පර්යේෂණ හා ප්‍රකාශන** | **විස්තර** | **අදාළ වර්ෂය** |
|---|---|---|
| පර්යේෂණාත්මක ප්‍රකාශන | | |
| නිබන්ධන | | |
| නව්‍යතා/ නවෝත්පාදන | | |
| පුවත්පත් ලිපි | | |

❖ පර්යේෂණ සාරාංශය සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය.

**4.** අයදුම්කරුගේ ප්‍රකාශය :

ඉහත සඳහන් තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය : ..............................          ........................................

අයදුම්කරුගේ අත්සන

II කොටස

( දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කළයුතු වේ)

........................................................................................ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ නිලධාරී ........................................................................................ ....................................................... මයා / මිය/ මෙනවිය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පතෙහි සඳහන් තොරතුරු පෞද්ගලික ලිපිගොනුවෙහි ඇති තොරතුරු අනුව නිවැරදිය / වැරදිය. ඔහුට / ඇයට විරුද්ධව විනය ක්‍රියාමාර්ග කිසිවක් නොමැති / ගෙන ඇති බවත්, එවැනි ක්‍රියාමාර්ග ඉදිරියේ දී ගැනීමට අදහස් කර නොමැති / ඇති බවත්, අයඳුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 05ක වැටුප් වර්ධක උපයාගෙන ඇති / නැති බවත්, කාරුණිකව දන්වා සිටිමි. ඔහුගේ / ඇයගේ අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි.

.........................................................

අමාත්‍යාංශ ලේකම්ගේ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව

දිනය